

# රට හැර යන බුද්ධිමත්තු

රට වැසියකු තමන් උපන් රටේ මහජන මුදලින් උගතකු බවට පත් ව ස්වකීය නිජබිම හැර යාම බුද්ධි ගලනය නම් වේ. මෙය වර්තමානයේ උග්‍ර ව පවත්නා ගැටලුකාරී තත්ත්වයකි. මේ මගින් වැඩිපුරම පීඩාවට පත් වන්නේ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ය. උගතුන් පමණක් නොව රටේ සංවර්ධන කාර්යය සඳහා අත්‍යවශ්‍ය මහජන කොටසක් වන පුහුණු ශ්‍රමිකයන් ද වැඩි වශයෙන් රට හැරයාම මේ රටවල බහුල ව දක්නට ලැබේ. අනෙක් කරුණ වනුයේ, බුද්ධි ගලනය වන්නේ සංවර්ධිත රටවල් කරා වීමයි.

යථෝක්ත තත්ත්වයට හේතු සාධක වනුයේ, සංවර්ධනය වෙමින් පවතින රටවල පවත්නා ආර්ථික, සමාජ දේශපාලන වටපිටාව බවට ඔප්පු වේ. තම මව් රටේ ලබන වැටුප මෙන් කිහිප ගුණයක් වැඩි වැටුප් ලබා ආර්ථික වශයෙන් පොහොසත් වීමට දක්වන්නා වූ කැමැත්ත බුද්ධි ගලනයට බලපාන ප්‍රධාන හේතුවයි. තව ද තමන්ට සහ තමන් ගේ දරුවන්ට ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යාපනයක් ලබා ගැනීම, උසස් තාක්ෂණික දැනුමක් ලබා ගැනීම වැනි කරුණු ද අර්බුදය උත්සන්න කිරීමට හේතු වී ඇත.

තව ද විශේෂයෙන්ම ශ්‍රී ලංකාව වැනි තවමත් 'සංවර්ධනය වෙමින් පවතින' ලෙස හඳුන්වන රටක දේශපාලනික සාධක ද බලපා ඇත. දේශපාලනඥයන් උගත්කම රැකියා වෙළෙඳපොළ සඳහා සුදුසුකමක් කොට නො ගෙන ඔවුන් ගේ පාක්ෂිකයන්ට, ඡන්ද ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් රැකියා ලබාදීම සිදු කිරීම උගතුන් තුළ දැඩි කලකිරීමක් ඇති කිරීමට හේතු වනු ඇත. තව ද දූෂණය, අක්‍රමිකතා හා අවංක සේවාවට අප රට තුළ පවත්නා පෙළඹවීමේ මදිකම ද හේතු වී ඇත.

අධිරාජ්‍යවාදීන් රට තුළ ඉතුරු කොට ගිය තවත් ප්‍රශ්නයකි මෙය. අතීතයේ අප රට සතු සියලු සම්පත් කොල්ල කෑ විදේශිකයන් මෙකල අප ගේ මානව, භෞතික සහ බුද්ධිමය දේපළ ද කොල්ලකෑම අතිශයෝක්තියක් නො වේ.

අමෙරිකාව, බ්‍රිතාන්‍ය, නවසීලන්තය, කැනඩාව, වැනි සංවර්ධිත රටවල වෛද්‍ය වෘත්තිය, ගණකාධිකරණ, ඉංජිනේරු, කළමනාකරණ වෘත්තියේ ද වැඩි වශයෙන් සේවය කරනුයේ ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා රටවල පුරවැසියන් ය. අධ්‍යාපනය සඳහා විදෙස් ගත වූ සිසුන් ඉන්පසු රැකියා කරනුයේ ද එම රටවල වීමෙන් අර්බුදයේ තීව්‍රත්වය තවත් වැඩි කරයි.

අප සංවර්ධිත රටවලින් ආධාර ගෙන ඒ මත යැපෙන රටක් ලෙස නම් පට බැඳුණ ද, තර්කානුකූල ව මෙසේ ද සිතිය හැකි ය. අප ශ්‍රමිකයන් විදෙස්ගත ව ඔවුන්ට සේවය කොට ලබා දෙන විනිමය හා සසඳන කල ඔවුන් ගෙන් අප විදේශාධාර ලෙස ලබා ගනුයේ ඊට වඩා අඩු මුදලක් බව සංඛ්‍යා ලේඛනවලින් ඔප්පු කළ හැකි ය. ඒ අනුව අප ධනවත් රටවලට ආධාර දෙනවාදැයි විටෙක සිතේ.

රටේ බුද්ධි ගලනය වැළැක්වීමට රජය වහා පියවර ගත යුතු ය. මෙහිදී රැකියා ක්ෂේත්‍රයේ කටයුතු සඳහා දේශපාලන මැදිහත්වීම් අවම කිරීම, උගත්, පුහුණු ශ්‍රමිකයන් ගේ අත්දැකීම්වලට මුල්තැන දීම, උසස් අධ්‍යාපන පහසුකම් පුළුල් කිරීම, බුද්ධිමතුන් ගේ අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රතිපාදන ඉහළ නැංවීම ද කළ යුතුම ය.

තවද අප ළමා පරපුරේ ආකල්ප ද වෙනස් කළ යුතුම ය. කුඩා කල පටන් ම ළමා මනසට ඇතුළත් කළ යුත්තේ උගතුන් වී අප රටට සේවය කිරීමේ වැදගත්කමයි. හැකිතාක් දුරට බටහිර ගැති වහල් මානසිකත්වයෙන් ඔවුන් මුදා හළ යුතු ය.

අවම වශයෙන් හෝ බුද්ධි ගලනය පාලනය කොට රට තුළ බුද්ධිමතුන් රඳවා ගෙන, අතිරික්තයක් ඇත්නම් පමණක් විදේශ ගත වීමට ඉඩ හැරීමේ වරදක් නැත. හේතුව විදෙස් රටවලින් ලැබෙන නව දැනුම් සම්භාරය ද, ලැබෙන විදේශ විනිමය ද අප රටේ සංවර්ධනයට ම දායක වන බැවිනි. ■

**සසිකා ප්‍රියදර්ශනී**